# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 243/33 — 1976 දෙසැම්බර් 17 වැනි සිකුරාද — 1976.12.17

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (70)/76.

**(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥපනත**

අගමැතිගේ නිර්දේශය අනුව, මහාජන ආරක්ෂක ආඥපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

**වි. ගොපල්ලව,**
ජනාධිපතිවරයා.

1976 දෙසැම්බර් මස 17 වැනි දින,
**කොළඹ,**
**ජනාධිපති කාර්යාලයේ දී ය.**

**නියෝග**

1. මේ නියෝග හදිසි අවස්ථා (වතු කම්කරුවන්ගේ සහතික අවම වේතන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) (අ) මේ නියෝගවල කටයුතු සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

(ආ) මේ නියෝගවලින් නියම බලධරයා වෙත පවරා හෝ නියම කර ඇති යම් බලතල, කටයුතු හෝ කාර්යයන් ඒ නියම බලධරයා විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකිය.

(2) යම් ලිඛිත නීතියක් යටතේ තබා ගැනීමට නියමිත යම් ලේඛනයක්, වේතන වාර්තාවක් හෝ නාම ලේඛනයක් පරීක්ෂා කිරීමේ හෝ මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේ ද යන වග නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා, යම් වත්තක සේවයේ යෙදී සිටින යම් කම්කරුවකු විභාග කිරීමේ කටයුත්ත සඳහා යම් වත්තකට ඇතුළු වීමට නියම බලධරයාට බලය ඇත්තේ ය.

3. වෙන යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා ගිවිසුමක කුමක් සඳහන්ව ඇත ද මෙම නියෝගවල විධිවිධාන වලංගුව බලපැවැත්විය යුතු අතර ඒ අනුව, මේ නියෝගවල විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇති වූ අවස්ථාවක ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ නියෝගවල විධිවිධාන බලපැවැත්විය යුතුය.

4. ප්‍රමාණය අක්කර එක් සියයකට අඩු නොවන්නා වූ ද, පහත සඳහන්, එනම් තේ, රබර්, පොල්, කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් යන බෝගවලින් එකක් හෝ වැඩි ගණනක් වගා කොට තිබෙන්නා වූ ද වත්තක නාම ලේඛනයෙහි නම සඳහන් සෑම කම්කරුවකුට ම මේ නියෝග අදාළ වන්නේ ය.

5. මේ නියෝග අදාළ වන්නේ යම් කම්කරුවකුට ද ඒ කම්කරුවාට සේවා යෝජකයකු විසින් වේතන වශයෙන් ගෙවනු ලැබිය යුතු මුදල—

(අ) 1974 අගෝස්තු මස 1 වන දිනයෙන් ආරම්භව 1974 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලපරිච්ඡේදය වෙනුවෙන් ඒ කාලපරිච්ඡේදය තුළ යටත් පිරිසෙයින් වැඩ කරන දින 90ක වත් ඒ කම්කරුවා වැඩට පැමිණ පෙනී සිටියේ නම්, සහ ඔහු එසේ පැමිණ පෙනී සිටි විට වැඩ දෙනු ලැබූ අවස්ථාවල, එසේ වැඩ දෙනු ලැබූ දිනයන්හි ඔහු වැඩ කරන්නේ නම් ; සහ———

(ආ) (අ) ඡෙදයෙහි සඳහන් කාලපරිච්ඡෙදයෙන් පසු එක් එක් හය මාසයේ කාලපරිච්ඡෙදය වෙනුවෙන් ඒ එක් එක් කාලපරිච්ඡෙදය තුළ යටත් පිරිසෙයින් වැඩ කරන දින 108ක් වත් ඒ කම්කරුවා වැඩට පැමිණ පෙනී සිටියේ නම්, සහ ඔහු එසේ පැමිණ පෙනී සිටි විට වැඩ දෙනු ලැබූ අවස්ථාවල, එසේ වැඩ දෙනු ලැබූ දිනයන්හි වැඩ කරන්නේ නම්,

සහතික අවම වේතන ප්‍රමාණයට අඩු නොවිය යුතුය.

6. මේ නියෝග අදාළ වන කම්කරුවකු 5 වන නියෝගයෙහි සඳහන් යම් කාලපරිච්ඡෙදයක් තුළ, ඒ කාලපරිච්ඡෙදය ඇතුළත වැඩ කරන දින ගණන දින 90කට හෝ දින 108කට අඩුවීමේ හේතුව නිසා හා ඒ නිසා පමණක් අවස්ථාවෝචිත පරිදි, යටත් පිරිසෙයින් වැඩ කරන දින 90ක් හෝ වැඩ කරන දින 108ක් වැඩට පැමිණ පෙනී සිටීමට අපොහොසත් වුවහොත්, එසේ අපොහොසත් වූයේ වී නමුදු, සහතික අවම මුදල ගෙවනු ලැබීමට ඒ කම්කරුවා හිමිකම් ලබන්නේ ය.

7. මේ නියෝගය අදාළ වන කම්කරුවකුගේ සෑම සේවායෝජකයකුම විසින් නොබැඳි කොළැති නාම ලේඛනයක් පවත්වා ගෙන යා යුතු අතර වැඩ කරන දිනයක වැඩට පැමිණ පෙනී සිටින කම්කරුවන්ගේ නම් එහි සටහන් කළ යුතුය. කම්කරුවන් වත්තේ වැඩට පැමිණ පෙනී සිටින ස්ථානයෙහි ඒ නාම ලේඛනය තැබිය යුතු අතර සේවායෝජකයා විසින් පිළිගෙන ඇති වෘත්තීය සමිතියේ වතු කමිටුවේ නියෝජිතයකු විසින් සහ වත්තේ යම් කම්කරුවකු විසින් පරීක්ෂා කිරීම පිණිස එය විවෘතව තිබිය යුතුය.

8. සේවායෝජකයා විසින් පිළිගන්නා ලද වෘත්තීය සමිතියක වතු කමිටුවක නියෝජිතයකුට, කම්කරුවන් වැඩට පැමිණ පෙනී සිටින වේලාවල දී සහ ස්ථානවල දී ද වැඩෙන් පසුව ද වත්තට පැමිණ සිටීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

9. (1) මේ නියෝග අදාළ වන කම්කරුවකුට 5 වන නියෝගයෙහි සඳහන් යම් කාලපරිච්ඡෙදයක් තුළ සේවායෝජකයකු විසින් වේතන වශයෙන් ගෙවනු ලැබූ වේතනවල මුදල් සහතික අවම මුදලට අඩුවන අවස්ථාවක, සහතික අවම මුදල හා ඒ කාල පරිච්ඡෙදය තුළ වේතන වශයෙන් ගෙවන ලද මුදල හා අතර වෙනස එකී කාලපරිච්ඡෙදයේ අවසානයෙන් දින 30කට වඩා පසු නොවී එම සේවායෝජකයා විසින් ඒ කම්කරුවාට ගෙවිය යුතුය.

(2) (1) වන ඡෙදය යටතේ කම්කරුවකුට ගෙවීමට නියමිත මුදල ගෙවීම යම් සේවායෝජකයකු විසින් පැහැර හැරීමේ හේතුවෙන් වූ වරදකට එම සේවායෝජකයා අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට, එම අධිකරණය විසින්, එම වරද සම්බන්ධයෙන් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් දණ්ඩනයකට අමතරව, ආඥාවෙහි සඳහන් කාලපරිච්ඡෙදයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම සේවායෝජකයාට අණ කරනු ලැබිය හැකි අතර, එම මුදල එසේ නොගෙවන ලද්දේ නම්, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් වූ පරිද්දෙන් එම මුදල් අධිකරණයේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකිය.

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල—

" කොමසාරිස්වරයා " සහ " කම්කරුවා " යන පාඨවලට, පිළිවෙලින් (236 වන අධිකාරය වූ), පඩි පාලක සභා ආඥාපනතෙහි දී ඇති අර්ථම ඇත්තේ ය ;

" සාමූහික ගිවිසුම " යන්නට කාර්මික ආරාවුල් පනතෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය ;

" දෛනික අවම වේතනය " යන්න කම්කරුවකු සම්බන්ධයෙන් යෙදෙන විට—

(අ) කම්කරුවා අයිති යම් කර්මාන්තයකට ද ඒ කර්මාන්තයේ උචිත පඩි පාලක සභාව විසින් නියම කොට ඇති දෛනික වේතනයේ,

(ආ) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද නියෝග යටතේ එක් දිනයකට කම්කරුවාට ගෙවිය යුතු වන යම් මුදලක,

(ඇ) 1968 අංක 40 දරන කම්කරුවන්ගේ අවමූල්‍යායන ආන්තරික දීමනා පනත යටතේ එක් දිනකට කම්කරුවාට ගෙවිය යුතු වන මුදලේ, සහ

(ඈ) යම් සාමූහික ගිවිසුමක විධිවිධාන අනුව හෝ යම් සාමූහික ගිවිසුමක් පදනම් කොට ගෙන එක් දිනකට කම්කරුවාට ගෙවිය යුතු වන යම් මුදලක

මුළු එකතුව ඉන් අදහස් වේ.

" සහතික අවම මුදල " යන්නෙන්—

(අ) 5 වන නියෝගයේ (අ) ඡෙදයෙහි සඳහන් කාලපරිච්ඡෙදය සම්බන්ධයෙන් වූ විට, එම කාලපරිච්ඡෙදය තුළ කම්කරුවාට ලැබීමට හිමිකම් ඇති සාමාන්‍ය හෝ දෛනික අවම වේතනයට සමාන මුදල 90න් ගුණ කළ විට ලැබෙන ප්‍රමාණය අදහස් වේ, තවද

(ආ) 5 වන නියෝගයේ (ආ) ඡෙදයෙහි සඳහන් එක් එක් හය මාසයේ කාලපරිච්ඡෙදය සම්බන්ධයෙන් වූ විට, ඒ එක් එක් කාලපරිච්ඡෙදය තුළ කම්කරුවාට ලැබීමට හිමිකම් ඇති සාමාන්‍ය හෝ දෛනික අවම වේතනයට සමාන මුදල 108න් ගුණ කළ විට ලැබෙන ප්‍රමාණය අදහස් වේ.

" වැඩ කරන දිනයක් " යන්න වත්තක් සම්බන්ධයෙන් යෙදෙන විට වත්තෙහි වැඩ කරනු ලබන දිනයන් ඉන් අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී